සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

වාර්ෂික වාර්තාව *2020/21*

කෘෂිකර්ම අමාත්‍යාංශය

දැක්ම

“එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පෝෂ්‍යදායී පොස්පරස් මඟින් අපගේ මාතෘභූමියේ සාරවත් පසක් නිර්මාණය කිරීම”





මෙහෙවර

“පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සැපිරීම"

පටුන

- හැඳින්වීම 01
- අධ්‍යක්ෂක මණ්ඩලය 02
- කළමනාකරණ කණ්ඩායම 03-04
- සභාපතිතුමාගේ ප්‍රකාශය 05-06
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 07-09
- මෙහෙයුම් සමාලෝචනය 2020/21 10-13
- මූල්‍ය ඉස්මතු කිරීම් 14
- ආයතනික ව්‍යුහය 15
- අනුමත කාර්ය මණ්ඩලය 16
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 17
- විගණකවරුන්ගේ වාර්තාව 18-23
- මූල්‍ය ප්‍රකාශන
  - කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 24
  - 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 25
  - කාල පරිච්ඡේදය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 26
  - කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 27
  - සංස්ථාපිත තොරතුරු, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ මුල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 28-52
- රැස්වීම් වාරය දැනුම්දීම 53
- පෙරකලාසියේ ආකෘතිය 54

හැඳින්වීම

සමාගමේ නම

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

සී/ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් හා බණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය ලෙස 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරනු ලැබ ඇත.

මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

බහු වාර්ෂික කෘෂි භෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම් සැකසුම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

ලියාපදිංචි අංකය

පී.බී.308

අධ්‍යක්ෂ මණ්ඩලය

ඉංජිනේරු අනිල් රණසිංහ මහතා	- සභාපති
එන්.එම්.එස්.කරුණාදාස මහතා	- අධ්‍යක්ෂ
ඒ.පී.මොරගොඩ මහතා	- අධ්‍යක්ෂ
ඩී.ආර්.ටී.රුවන්පුර මහතා	- අධ්‍යක්ෂ
ජේ.ඒ.ඩබ්.ජයසූරිය මහතා	- අධ්‍යක්ෂ
එස්.අබේවර්ධන මහතා	- අධ්‍යක්ෂ

සමාගමේ ලේකම්

සී/ස මූල්‍ය සේවා සහ වෙළඳ නියෝජිත පුද්ගලික සමාගම, 300/72, නාවල පාර, නාවල

අවසාන මව් සමාගම

ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් පිළිබඳව සම්පූර්ණ අයිතිය ඇත.

රේඛීය අමාත්‍යාංශය

කෘෂිකර්ම අමාත්‍යාංශය,
80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල

ලියාපදිංචි කාර්යාලය

අංක 73 1/1, නව කැළණි පාලම පාර,
කොළඹ 14.
දුරකථන අංකය - 94112459906/7
ෆැක්ස් අංකය - 94112459908

විගණකවරු

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
නො : 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල

බදු උපදේශකවරු

අමරසේකර සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු,
නො.12 - රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03.

බැංකුකරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

අධ්‍යක්ෂක මණ්ඩලය



ඉංජිනේරු අනිල් රණසිංහ මහතා
සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ



එන්.එම්.එස්. කරුණාදාස මහතා
අධ්‍යක්ෂ



ඒ.පී. මොරගොඩ මහතා
අධ්‍යක්ෂ



ඩී.ආර්.ටී. රුවන්පුර මහතා
අධ්‍යක්ෂ



එස්. අබේවර්ධන මහතා
අධ්‍යක්ෂ



ජේ.ඒ.ඩබ්. ජයසූරිය මහතා
අධ්‍යක්ෂ

කළමනාකරණ කණ්ඩායම



එච්. ආර්. යු. ඩී. බණ්ඩාර
සාමාන්‍යාධිකාරී



ආර්.එම්.පී. කරුණාරත්න
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



ඩී. පී. යු. චාමර
මුල්‍ය කළමනාකරු



එස්.ඩී. රූපසිංහ
මෙහෙයුම් කළමනාකරු



එම්.එම්.ඩී. තිලකරත්න
මානව සම්පත් කළමනාකරු



කපිතාන් කේ.පී.ආර්.පී. කිරිඇල්ල
ආරක්ෂක කළමනාකරු



ඩී. ආර්.කේ. තිලකරත්න
ගණකාධිකාරී



ආර්. ඒ. ඒ. පී. රණසිංහ
අලෙවි විධායක



එච්.ඒ.ටී. ජයනන්ද
යාන්ත්‍රික ඉන්ජිනේරු



ඩී.බී. කීරියාවත්ත
අභ්‍යන්තර විගණක



එල්.එල්.ඩී.අයි. පැතුම්
නිෂ්පාදන ඉංජිනේරු



එස්. ඒ. අබේසිරි
සැපයුම් නිළධාරී



එස්.එම්.ඒ.ආර්.කේ. මංචනායක
කාර්යමණ්ඩල නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)



ඩී.ආර්. ගුණරත්න
කම්හල් නිළධාරී



ආර්.එම්. මද්දුමබණ්ඩාර
සැපයුම් නිළධාරී



ඩී.එස්.එම්. දිසානායක
ගබඩා නිළධාරී

සභාපතිවරයාගේ පණිවිඩය

පොස්පේට් පාශාණය කෘෂිකර්මාන්තයට හා අනිකුත් කර්මාන්තවලට උපයෝගී කරගන්නා බොහෝ ප්‍රයෝජන ඇති වැදගත් වානිජ මූලයකි. ශාක වැඩීමට හා ප්‍රවර්ධනය පොස්පේට් ඉතා අත්‍යවශ්‍ය පෝෂකයකි. ගෝලීය පොස්පේට් පරිභෝජනය පොහොර කර්මාන්තයේ සිට විෂබීජනාශක ද්‍රව්‍ය නිෂ්පාදන (සෝදන ද්‍රව්‍ය) කර්මාන්තය, පිඟන් කර්මාන්තය හා වෙනත් කර්මාන්ත විශාල ගණනකට අදාළ වේ. ලෝක වෙළඳපොළ තුළ රොක් පොස්පේට් වඩාත් ස්වාභාවික හා තිරසාර බැවින් රසායනික පොස්පේට් පොහොර සඳහා කාබනික විකල්පයක් ලෙස පිළිගනු ලැබේ.

ලෝක පොස්පේට් සංචිත සීමාසහිත වන අතර නැවත ජනනය නොවේ. එමනිසා ඒවා උපරිම හා තිරසාර ක්‍රියාවලියක් තුළ ප්‍රයෝජනයට ගත යුතුයි. ලෝකයේ පොහොසත්ම සහ අසම සම එක් පොස්පේට් නිධියක් ලෙස සළකන ශ්‍රී ලංකාවේ පොස්පේට් සංචිතය 33% 40% ක පමණ P_2O_5 ඛණිජ අඩංගුවේ. 1971 දී එප්පාවල පොස්පේට් නිධිය සොයාගත් අතර, එය පොස්පේට් මෙ.ටො. මිලියන 60ක සංචිතයකි. ශ්‍රී ලංකාවේ දේශීය පොස්පේට් පොහොර අවශ්‍යතාවය සපුරාලීමට ලංකා පොස්පේට් සමාගම රොක් පොස්පේට් පොහොර නිපදවීම සිදුකරයි. වර්තමාන ධාරිතව අනුව ලංකා පොස්පේට් සමාගම දේශීය අවශ්‍යතාවය සඳහා එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙ.ටො 50,000ක් පමණ වාර්ෂිකව නිපදවන අතර, එය පුද්ගලික හා රාජ්‍ය පොහොර සමාගම් හරහා ගොවියන් වෙත බෙදාහරී.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක්පොස්පේට් (ERP) සහ අධි - ශ්‍රේණියේ එප්පාවල රොක්පොස්පේට් (HERP) යනුවෙන් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා ශ්‍රී ලංකාවේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ. මීට අමතරව සමාගම විසින් පොල් පොහොර මිශ්‍රණාගාරයක් 2014 වර්ෂයේ සිට පවත්වාගෙන යයි.

රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් වලට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ කොන්දේසි යටතේ පොස්පේට් සමාගම 1992 ජූලි මස 10 වන දින සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීමටය. මෙම සමාගමෙහි සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සතුවෙයි. 1998 නොවැම්බර් මස බෝගල ග්‍රැපයිට් ආයතනයේ වෙන්වීමත් සමඟ ලංකා පොස්පේට් සමාගම සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් බවට පත්විය.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සෞභග්‍යයේ දැක්ම තුළින් ඉදිරි කෘෂිකාර්මික දියුණුව තුළින් සෞඛ්‍ය සම්පන්න හා ඵලදායී සමාජයක් බිහිකිරීම සඳහා ලංකා පොස්පේට් සමාගමට රටේ පොහොර නිෂ්පාදන කර්මාන්තය තුළින් භාරදූර කාර්යභාරයක් ඉටු කිරීමට තිබේ.

සමාගමේ ඉතිහාසය තුළ නවතම ජයග්‍රහණය ලෙස “එප්පාවල පොහොර” යන සන්නාමය යටතේ සෘජුවම ගොවීන්ට ERP පොහොර මිශ්‍රනය සාධාරණ මිලකට ලබාදීම දැක්විය හැකිය. සමාගම වර්තමානයේ තාක්ෂණික උන්නතිය හා නිෂ්පාදනය නැංවීම තුළින් කර්මාන්තයේ ප්‍රමුඛ භූමිකාවක් අත්පත්කර ගැනීමේ ක්‍රියාවේ යෙදී සිටී.

2020/2021 න් අවසන් ගිණුම් වර්ෂයේදී දළ ආදායම රුපියල් මිලියන 750 ක් වූ අතර එය ලංකා පොස්පේට් ඉතිහාසයේ ඉහළම පිරිවැටුමකි. එසේම, සමාගම රු. මිලියන 120.96 ක මෙහෙයුම් ලාභයක් ලගාකර ගැනීම 2015/2016 වර්ෂයෙන් පසු ලගාකරගත් විශිෂ්ඨ ජයග්‍රහනයකි. LPL සමාගම රු.මිලියන 150.58 ක බදුපෙර ලාභයක් 2020/2021 වර්ෂයේ ලගාකරගැනීම පසුගිය වර්ෂයේ රු.මිලියන 13.48 හා සැසඳීමේදී 600% ක වැඩිවීමකි.

තවද ලංකා පොස්පේට් ඉතිහාසයේ ඉහළම විකුණුම් අගය වූ එප්පාවල පොස්පේට් (ERP) මෙට්‍රික් ටොන් 54,494 ක් ද, අධි ශ්‍රේණියේ එප්පාවල රොක් ෆොස්පේට් පොහොර (HERP) මෙට්‍රික් ටොන් 8,874 හා පොල් පොහොර මිශ්‍රනය (අනිකුත් මිශ්‍රණ) මෙට්‍රික් ටොන් 1,019 ක්ද වශයෙන් විකුනුම් අගයන් ලගාකර ගෙන සිටී.

එප්පාවල පොස්පේට් නිධියේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අදාළව පවත්නා හා නව ව්‍යාපාරික අවස්ථා දියුණු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. රටේ සමස්ථ කෙටි කාලීන බෝගවලට අවශ්‍ය වඩාත් ගැලපෙන පොස්පේට් වර්ග නිපදවීම ජාතික අවශ්‍යතාවයක් සහ වැදගත්කමක් ලෙස අප හඳුනාගෙන තිබේ.

එමනිසා, සමාගමේ මීළඟ ඍණික අවශ්‍යතාවය ලෙස දේශීය SSP නිෂ්පාදනය හඳුන්වාදීමේ මූලික පියවර දැනටමත් ආරම්භ කර ඇත.

වගකීමක් ඇති රජයේ ආයතනයක් ලෙස ලංකා පොස්පේට් සමාගම, මීට අමතරව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව "බයෝ ග්‍රීන් පොස්පේට්", බයෝ ෆල්ම් පොස්පේට් වැනි පරිසර හිතකාමී පොහොර වර්ග නිපදවීම වරිපනම් එකතු කිරීම් ක්‍රියාවලිය තුළින් ඉදිරියේදී පියවර ගනු ලැබේ.

වටිනාකම් එකතු කරන ලද නිෂ්පාදන, මානව හිතවාදී පරිසර හා කාර්යමණ්ඩල පුහුණුවීම් වැඩ සටහන් වලට ප්‍රමුඛත්වය දෙමින් සේවකයන්ගේ කුසලතාවයන් හා හැකියාවන් සෑම අංගයකින්ම වැඩි දියුණු කිරීමට අපි එකතු වී වැඩ කරන්නෙමු.

අවසාන වශයෙන්, මේ සම්බන්ධයෙන් අප වෙත මඟ පෙන්වීම, ධෛර්‍යය, සහයෝගය හා දේශපාලන නායකත්වය ලබාදෙන කර්මාන්ත අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුදකරමි.

ලංකා පොස්පේට් සමාගමට එහි ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.

.

ඉංජිනේරු අනිල් රණසිංහ
සභාපති
ලංකා පොස්පේට් සමාගම

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා පොස්පේට් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ විගණනය කරන ලද ගිණුම් සහ 2021 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

1.0 සමාගමේ නම

සී/ස ලංකා පොස්පේට් සමාගම (ලි.ප.අ. PB 308)

2.0 පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජූලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබීය.

3.0 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදුකිරීම, සකස් කිරීම හා අලෙවි කිරීම හා පොල් පොහොර මිශ්‍ර කිරීමයි

4.0 මූල්‍ය ප්‍රකාශනය

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් වාර්තා කරන දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව සාධාරණව සහ ඒකාකාරීව නිගමන හා තක්සේරුකිරීම් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැති බව ඔවුන්ගේ අදහසයි සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් වත්කම්වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත්, වංචා සහ අනෙකුත් අවිධිමත් කටයුතු වලක්වාගැනීමට සහ අනාවරණය කරගැනීමටත් පියවර ගෙන ඇත.

5.0 මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගණුදෙනු නිසි ලෙසට පෙන්නුම් කිරීමට සාධාරණව ඥාණාන්විතව සහ තක්සේරු කිරීම්වලට එළැඹීම සඳහා මනා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතයට ගෙන ඇත. ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ගිණුම්කරණ පිළිවෙත්වල කිසිදු වෙනසක් සිදු නොවීය.

6.0 දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ ගණනය කිරීම් සහ ක්ෂයවීම

සමාගම විසින් වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ සඳහා දරා ඇති ප්‍රාග්ධන වියදම රු. 3,881,307.00 කි. දේපළ, පිරියත හා උපකරණවල ගණනය කිරීම හා ක්ෂය කිරීම්වල විස්තර මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 5.0 හා 26 හි පෙන්වා ඇත.

7.0 බදුකරණය

සමාලෝචිත වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම මත ව්‍යාපාරික ආදායම සඳහා 18% ක් සහ වෙනත් ආදායම් සඳහා 24% ක් සමාගම බදු ගෙවිය යුතුවේ.

8.0 ලාභාංශ

සමාලෝචනය කරන වසර ඇතුළත අතුරු ලාභාංශ ප්‍රකාශයට පත්කර නොමැත.

9.0 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රුපියල් 72,510,000/- සාමාන්‍ය කොටස් 7,251,000 කින් සමන්විත වේ. සමලෝචනයට භාජනය කරන වසර ඇතුලතද ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් සිදුවී නොමැත.

10.0 කොටස් හිමිකාරීත්වය

පොදු සංස්ථා හෝ රජයට අයිතිව ඇති පවරා ගන්නා ලද ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ 2(3) වගන්තිය යටතේ සමාගමේ එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් (රාජකාරී මට්ටමින්) භාණ්ඩාගාර ලේකම්ය

2021 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරීත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදිවේ

භාණ්ඩාගාර ලේකම්ට (රාජකාරී මට්ටමින්) සාමාන්‍ය කොටස් 7,251,000 කි.

සී/ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී/ස ලංකා පොස්පේට් සමාගම සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරත්වය දරයි. (එකක් රු.10/- බැගින්)

මෙහි හිමිකාරත්වය දැරීමේ ප්‍රතිශතය 16.66% කි.

11.0 කොටස් හිමිකාරත්වයේ වෙනස්වීම

සමාගමේ කොටස් හිමිකාරත්වයේ කිසිදු වෙනස්වීමක් 2021 මාර්තු 31 දින වන විට සිදුවී නැත.

12.0 සංස්ථාපිත සමාජ වගකීම

සමලෝචන වර්ෂය ඇතුලත සමාගම විසින් පුන්‍ය කටයුතු හා ආයතනික සමාජ වගකීම් සඳහා රුපියල් 12,220.00 ක් දරා ඇත.

13.0 සේවකයින්

වර්ෂය ඇතුලත සම්පූර්ණ සේවක මණ්ඩල පිරිවැය රුපියල් 325,078,182.00 කි.

වර්ෂය අවසානය වන විට සමාගම විසින් සේවයේ යොදවා ඇති සාමාන්‍ය සේවක සංඛ්‍යාව 325 ක් වේ.

14.0 අධ්‍යක්ෂකවරුන්

සමාලෝචිත වසර ඇතුලත පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරීය.

ඉංජිනේරු අනිල් රණසිංහ මහතා	-	සභාපති
එන්.එම්.එස්. කරුණාදාස මහතා	-	අධ්‍යක්ෂ
ඒ.පී. මොරගොඩ මහතා	-	අධ්‍යක්ෂ
ඩී.ආර්.ටී. රුවන්පුර මහතා	-	අධ්‍යක්ෂ
ජේ.ඒ.ඩබ්. ජයසූරිය මහතා	-	අධ්‍යක්ෂ
සුදත් අබේවර්ධන මහතා	-	අධ්‍යක්ෂ

15.0 අධ්‍යක්ෂකවරුන් පත්වීම හා ඉල්ලා අස්වීම

සමාලෝචිත වර්ෂය තුළ නව අධ්‍යක්ෂක ලෙස බදවා ගැනීම් නොමැත.

16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාලෝචිත වර්ෂය ඇතුලත රුපියල් 2,339,567.81 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ගාස්තු හා වියදම වශයෙන් ගෙවා ඇත.

17.0 <u>ව්‍යවස්ථාපිත ගෙවීම්</u>

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් නිවැරදිව සහ නියමිත දිනට කර ඇත.

18.0 <u>අනුකූලවීම</u>

මෙම සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීතිරීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ කටයුතුවල නියැලී නොමැත.

19.0 <u>අබණ්ඩ බවේ පැවැත්ම</u>

සමාගමේ මෙහෙයුම් කටයුතු ඉදිරි අනාගත කාලයක් දක්වා පවත්වා ගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ව්‍යාපාරය සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටින අතර ඒ අනුව සමාගමේ සෑම මූල්‍ය ප්‍රකාශනයක්ම අබණ්ඩ පැවැත්ම පදනම මත පිලියෙල කර ඇත.

20.0 <u>සංස්ථාපිත පාලනය</u>

අධ්‍යක්ෂ මණ්ඩලය හොඳ සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස්රුවන්ගේ අපේක්ෂා සහ අරමුණු මෙන්ම සමාගමේ අරමුණු වලට සමාන්තරව එහි කාර්යසාධනය පවත්වාගෙන යෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

21.0 <u>අවදානම් කළමනාකරණය</u>

සමාගම විසින් නීතිමය අවදානම අඩු කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන් ඉටුකර ඇති

22.0 <u>විගණකයින්</u>

සමාගමේ වර්තමාන විගණකවරු ලෙස රජයේ විගණකාධිපති කටයුතු කරයි.

නව විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සම්බන්ධව තීරණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය පැවරිය යුතු බවට යෝජනා කරන යෝජනාවක්ද වාර්ෂික මහා සභා රැස්වීමේදී සලකා බැලීමට කටයුතු කොට ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා 2021 මාර්තු 31 දිනට සමාගම විසින් සපයන ලද මුලු විගණන ගාස්තුව රුපියල් 400,000 ක් විය. බදු උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අමරසේකර සහ සමාගමට වර්ෂය සඳහා රුපියල් 227,500/- ක මුදලක් ගෙවන ලදී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමඟ හෝ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොවීය.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්:



සභාපති



සමාගම් ලේකම්වරු

අධ්‍යක්ෂිකා

මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2020/21

01. ආදායම

2019/2020 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 47% වර්ධනයක් සහිතව සමාගම් ඉතිහාසයේ වාර්තාගත ආදායම් ලබා ලංකා පොස්පේට් සමාගම වර්ෂය තුළ අත්පත් කර ගෙන ඇත. (රු.මි. 750 කි).

ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)



වටිනාකම (රුපියල් මිලියන)



02. ලාභය

මෙහෙයුම් ලාභය

2020/2021 සඳහා සමාගමේ මෙහෙයුම් ලාභය රු. 120.95 ක් වේ. 2015/2016 වසරෙන් පසු මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට සමාගමට නොහැකි වූ බැවින් එය කැපී පෙනෙන ජයග්‍රහණයකි.



බදුවලට පෙර ලාභය (PBT)

එය 2020/2021 මූල්‍ය වර්ෂය සඳහා PBT ලෙස සටහන් කර තිබුනේ රුපියල් මිලියන 150.58 ක් වන අතර, එය පසුගිය වසරට සාපේක්ෂව රුපියල් මිලියන 13.48 කි.



03. ශුද්ධ වත්කම - (කොටස්කරුවන්ගේ අරමුදල්)

පසුගිය වසර අගය වූ රු.මිලියන 831.38 සමග සසඳන විට වසර අවසාන ශුද්ධ වත්කම් තත්ත්වය රුපියල් මිලියන 943.87 ක් දක්වා 13.5% ක ප්‍රතිශතයකින් ඉහළ ගොස් තිබේ.



04 මුළු වත්කම

වර්ෂය තුළ මුළු වත්කම් අගය ක්‍රමයෙන් බිලියන 1 දක්වා ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ වසර තුළ ස්ථාවර තැන්පතු මත ආයෝජනය මිලියන 124 කින් වැඩි වීමයි.



<u>ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධනය</u>

I. රටට අවශ්‍ය පරිසර හිතකාමී සහ ලාභදායී පොහොර රට සඳහා නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම.

II. ක්‍රියාත්මක නොවන යන්ත්‍ර සූත්‍ර වැඩි දියුණු කිරීම සහ භාවිතා කිරීම සහ සමාගමේ නිත්‍ය මෙහෙයුම් සඳහා භාවිතා කිරීම. (උදා : ක්‍රෂර් යන්ත්‍රය /ඇඹරුම් යන්ත්‍ර ආදිය)

III. ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා පවතින නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නව යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ පවතින යන්ත්‍රාගාරය නවීකරණය කිරීම.

IV. සමාගමේ නිෂ්පාදන සහ ක්‍රියාවලි සඳහා ISO සහතිකය ලබාගැනීම.

V. මෙහෙයුම්වල ඵලදායීතාව, නිරවද්‍යතාවය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ERP පද්ධතිය හඳුන්වා දීමට කටයුතු කර ඇත.

ප්‍රධාන කළමනාකරු

(සාමාන්‍යාධිකාරී)

මූල්‍ය ඉස්මතු කිරීම්

වර්ෂය සඳහා **(රු. '000)**

	2020/21	2019/20	2018/19	2017/18	2016/17
ආදායම	750,374	510,004	530,975	493,551	366,094
වර්ෂය සඳහා ශුද්ධ ලාභය (අලාභය)	124,017	5,489	33,960	3,220	(10,534)
මුළු විස්තීර්ණ ආදායම (වියදම)	117,494	18,821	109,726	(4,475)	(14,577)

වර්ෂ අවසාන දිනට **(Rs. '000)**

	2020/21	2019/20	2018/19	2017/18	2016/17
කොටස්හිමියන්ගේ අරමුදල	943,872	831,378	771,646	669,834	740,738
කාරක ප්‍රාග්ධනය	678,167	528,312	480,273	419,904	442,665
මුළු වත්කම්	1,099,694	948,648	892,603	757,572	836,113
කාර්ය මණ්ඩල පිරිවැය	325,078	303,310	292,861	230,782	224,678
සේවක සංඛ්‍යාව **(ගණන)**	325	333	328	333	335

කොටසකට

	2020/21	2019/20	2018/19	2017/18	2016/17
ඉපැයීම් **(රුපියල්)**	16.20	2.60	15.13	(0.62)	(2.01)
ශුද්ධ වත්කම් **(රුපියල්)**	130.17	114.66	106.42	92.38	102.16

අනුපාතයන්

	2020/21	2019/20	2018/19	2017/18	2016/17
දළ ලාභ අනුපාතය	46%	37%	36%	36%	32%
බදු පෙර ලාභ අනුපාතය	20.1%	2.6%	5%	3%	-9%
ජංගම අනුපාතය **(වාර)**	9.70	14.60	12.75	11.09	7.90
කොටස්හිමියන්ගේ අරමුදලට ප්‍රතිලාභ **(%)**	12.45%	2.26%	14.22%	-0.67%	-1.97%

ආයතනික ව්‍යුහය



අනුමත කාර්ය මණ්ඩලය

කාණ්ඩය	වැටුප් කේතය	තනතුර	තනතුරු අංකය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	HM - 2-1	සාමාන්‍යාධිකාරී	01
	HM - 1-3	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන	01
		නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නිෂ්පාදන නොවන	01
	HM - 1-1	මූල්‍ය කළමනාකරු	01
		නිෂ්පාදන කළමනාකරු	01
		මෙහෙයුම් කළමනාකරු	01
		පරිපාලන හා මානව සම්පත් කළමනාකරු	01
මධ්‍යම/මැදපෙළ කළමනාකරු	MM - 1-1	ගණකාධිකාරී	01
		යාන්ත්‍රික ඉන්ජිනේරු	01
		නිෂ්පාදන ඉන්ජිනේරු	01
		අභ්‍යන්තර විගණක	01
		සහකාර සැපයුම් කළමනාකරු	01
		සහකාර අලෙවි කළමනාකරු	01
		ආරක්ෂක කළමනාකරු	01
කනිෂ්ඨ කළමනාකරු	JM - 1 – 1	සැපයුම් නිළධාරී	01
		පරිපාලන නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)	01
		කම්හල් නිළධාරී	01
		ගබඩා නිළධාරී	01
කළමනාකාර සහායක	MA 2-1		28
	MA 1-1		30
ප්‍රාථමික මට්ටම	PL - 3		73
	PL - 2		80
	PL - 1		120
මුළු ගණන			**349**

විගණක සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරන ලද අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය. මහා භාණ්ඩාගාරය වෙනුවෙන් පත් කර ඇති අධ්‍යක්ෂක මෙම කමිටුවේ සභාපති ධූරය දරයි. රේඛීය අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා හා තවත් විධායක නොවන අධ්‍යක්ෂවරයකු කමිටුවේ අනික් සාමාජිකයන් වන අතර විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරී වරයෙක් හා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

කොවිඩ් 19 වෛරසයෙන් බලපෑම මැද වුවත් කලින් ඉදිරිපත් වී තිබූ ගැටළු සාකච්ඡා කිරීමට, කළමනාකරණ හා විගණන කමිටුව 2020/2021 වර්ෂය තුළ තුන්වතාවක් රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබා දීම සඳහා අභ්‍යන්තර විගණක විසින් භාරදෙන කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා හා පවත්නා පාලන විධි ඇගයීමට ලක් කරන ලදී.

නිගමනය

වාර්තාව සියුම් ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති හා මෙහෙයුම් පාලන විධි හා අවධානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා බලපාන වැදගත් ගැටළු නිවැරදි කිරීමට කමිටුව විසින් උපදෙස් දෙන ලදී. තවද සමහර වැදගත් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරන ලදී.



සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව
සී/ස ලංකා පොස්පේට් සමාගම

විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } IMU/A/LPL/FA/2020/06 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 දෙසැම්බර් 15 දින

සභාපති,

ලංකා පොස්පේට් සමාගම

ලංකා පොස්පේට් සමාගමේ ("සමාගම") 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා පොස්පේට් සමාගමේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2014 පෙබරවාරි 14 දින ආරම්භ කරන ලද පොල් පොහොර ව්‍යාපෘතිය සඳහා රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණ අතර ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව රු. මිලියන 72 ක පොල් පොහොර ආදායමක්, රු.මිලියන 10 ක ශුද්ධ ලාභයක් හා වාර්ෂිකව ආදායම් සියයට 10 කින් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. තවද පොල් පොහොර වෙළඳපලෙන් සියයට 10ක වෙළඳපල කොටසක් අත්පත් කර ගැනීම දිගුකාලීන අරමුණ වී තිබුණි. එසේ වුවද 2020 මැයි සිට නොවැම්බර් දක්වා ව්‍යාපෘතියට අමුද්‍රව්‍ය ලබා නොදීම මත පොල් පොහොර නිෂ්පාදනය සිදුවී නොතිබුණු අතර 2020 දෙසැම්බර් සිට 2021 මාර්තු කාලය තුල පොහොර නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලැබීම නිසා පොහොර නිෂ්පාදනය හා අලෙවියද ඉහළ ගොස් තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී චීනයේ පුද්ගලික ආයතනයකින් මිලදී ගන්නා ලද 6 Roller (TGM 160) මිල් යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් සැපයීමට නම් රු. 43,435,115ක වටිනාකමින් යුතු 6 Roller (TGM 160) නව මිල් ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගත යුතුය යන කොන්දේසිය මත චීනයේ වෙනත් පුද්ගලික ආයතනයකින් 2014 වර්ෂයේදී මිලදී ගත් නව මිල් යන්ත්‍රයේ රු.11,513,434 ක් වූ මිල් පාදම කොටස, 2014 – 2016 අතර කාලය තුල මිල් යන්ත්‍ර සඳහා මිලදී ගත් රු.14,290,237 ක අමතර කොටස් හා මෙම මිල් යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා නොනිමී වැඩ ලෙස පෙන්වා ඇති රු.7,440,000 ක ඉදිකිරීමද 2021 ජූලි 30 දින දක්වා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පැවතිණි.

(ඇ) ඉහල යන පොහොර ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි පොහොර සැපයීමට හා පොහොර ආනයන වියදම් අඩුකර ගැනීමේ අරමුණින් රු.34,654,178 කට පාවිච්චි කරන ලද ක්‍රෂර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර එම යන්ත්‍රයේ කිසිම කොටසක යන්ත්‍රයේ වර්ගය, මාදිලිය, නිෂ්පාදන

සමාගම හෝ නිෂ්පාදිත රට පිළිබඳව තොරතුරු අඩංගු නොවන බව එවකට සිටි නිෂ්පාදන කළමණාකරු විසින් ලිඛිතව ඡායාරූපමය සාක්ෂි සහිතව, සාමාන්‍යාධිකාරීට දැනුම් දී තිබුණි. එම යන්ත්‍රය ස්ථාපිත දින සිට 2021 ජූලි 30 දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. නවද නව ක්‍රෂර් යන්ත්‍රයක් වෙනුවට පාවිච්චි කරන ලද යන්ත්‍රයක් මිලදී ගැනීමෙන් පොස්පේට් සමාගමට සිදුවී ඇති අලාභය හා අදාල යන්ත්‍රය භාවිතයට නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධයෙන් සමාගමේ බලධාරීන් කටයුතු කර නොතිබුණි. එසේම මෙම යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අනාරක්ෂිතව තැබීම නිසා මේ වන විට යන්ත්‍රය විනාශ වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) රු.71,447,853ක් වූ ණයගැනි ශේෂය තුළ වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ වසර 3කට වැඩි කාලයක සිට හා එප්පාවල පොස්පේට් සමාගමේ වසර 6කට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.1,487,567ක හා රු.10,100,566ක ණයගැනි ශේෂයන් පැවති අතර මෙම ණය ශේෂයන් අයකර ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. මෙම ණයගැනි ශේෂයට වර්ෂ කිහිපයක සිට පැවත එන රු.550,000 ක බැර ශේෂ හා 2005 වර්ෂයේ සිට පැවත එන මුදලට විකුණුම් රු.2,475,958 ක ශේෂයන් ඇතුළත් කර තිබුණි. මෙම බැරශේෂ හා ඉහත සඳහන් මුදලට විකුණුම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් විය.

(ඉ) 2019 ජනවාරි 07 දින සිට ධාවනයෙන් ඉවත් කර වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ ඩබල් කැබ් රථය 2021 නොවැම්බර් 10 දින වන විටත් වෙන්දේසි කිරීමට හෝ ධාවනය සඳහා යොදාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාගමේ ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කම්කරු තනතුරු එකක්ද, දෛනික පදනම මත සේවකයන් 29 ක්ද, වතු සහායක තනතුරේ 03 ක්ද බඳවාගෙන තිබුණි.

(උ) 2016, 2017, 2018 වර්ෂයන් වල සිට පැවත එන රු.3,808,331 ක යල් පිනූ තොග ඉවත් කිරීම සඳහා විගණන දිනය වන විටත් සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(ඌ) වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ හා වෙනත් යන්ත්‍ර කොටස් යන්ත්‍රාගාර පරිශ්‍රයේ තැනින් තැන අනාරක්ෂිතව දමා තිබූ අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සී/ස ලංකා පොස්පේට් සමාගම
2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	2021 මාර්තු 31	2020 මාර්තු 31 (නැවත සකසන ලද)	වෙනස
ආදායම	**17**	750,374,365	510,003,580	240,370,785
විකුණුම් පිරිවැය	**18**	(404,998,186)	(321,281,896)	(83,716,290)
දළ ලාභය		**345,376,179**	**188,721,684**	**156,654,495**
කර්මාන්තශාලා හා පරිපාලන වියදම්	**19**	(213,959,775)	(208,317,417)	(5,642,358)
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	**20**	(10,034,935)	(3,114,485)	(6,920,450)
මූල්‍ය පිරිවැය	**21**	(425,040)	(133,234)	(291,806)
මෙහෙයුම් ලාභය		**120,956,430**	**(22,843,451)**	**143,799,881**
වෙනත් ආදායම්	**22**	29,626,039	36,323,614	(6,697,575)
බදු වලට පෙර ලාභය		**150,582,469**	**13,480,162**	**137,102,306**
බදු වියදම	**23**	(26,565,277)	(7,991,253)	(18,574,024)
වර්ෂය සඳහා ලාභය		**124,017,192**	**5,488,910**	**118,528,282**
අනෙකුත් විස්තීර්ණ ආදායම්				
වත්කම් ප්‍රත්‍යාගණනය මත විලම්බිත බදු වගකීම්	**24**	5,502,938	16,313,125	(10,810,187)
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණන අලාභ		(12,025,911)	(2,981,243)	(9,044,668)
වර්ෂය සඳහා මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම්		(6,522,973)	13,331,882	(19,854,855)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්		**117,494,219**	**18,820,792**	**98,673,427**
කොටසක ඉපැයුම් (රු.)	**25**	**17.10**	**0.76**	**16.35**

සී/ස ලංකා පොස්පේට් සමාගම

2021 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

වත්කම්	සටහන	2021 මාර්තු 31	2020 මාර්තු 31	වෙනස
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	5	342,927,249	380,361,981	(37,434,732)
කොටස්වල ආයෝජනය (GSMB Tech. Services (Pvt) Ltd)	6	1,000,000	1,000,000	-
		343,927,249	**381,361,981**	**(37,434,732)**
ජංගම වත්කම්				
තොග	7	107,190,952	104,269,949	2,921,003
වෙළඳ ලැබිය යුතු දෑ	8	64,756,536	35,169,168	29,587,368
තැන්පත්, ඉදිරියට කළ ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ	9	60,823,750	55,903,816	4,919,934
ලැබිය යුතු ආදායම් බදු	15	-	9,518,192	(9,518,192)
ස්ථාවර තැම්පතු හා භාණ්ඩාගාර බිල්පත්	10	461,124,816	336,447,850	124,676,966
මුදල් සහ මුදල් සමාන දෑ	11	61,870,868	25,977,564	35,893,304
		755,766,922	**567,286,538**	**188,480,384**
මුළු වත්කම්		**1,099,694,171**	**948,648,519**	**151,045,652**
හිමිකම් සහ වගකීම්				
ප්‍රාග්ධනය සහ සංචිත				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	12	72,510,000	72,510,000	-
ප්‍රත්‍යාගණන සංචිතය		133,955,774	128,452,836	5,502,938
රඳවා ගත් ලාභ		737,406,534	630,415,254	106,991,281
මුළු හිමිකම්		**943,872,308**	**831,378,089**	**112,494,219**
ජංගම නොවන වගකීම්				
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම	13	56,318,245	43,937,440	12,380,805
විලම්බිත බදු	14	21,903,935	34,358,741	(12,454,806)
		78,222,180	**78,296,181**	**(74,001)**
ජංගම වගකීම්				
වෙළඳ ගෙවිය යුතු දෑ		9,747,690	3,473,639	6,274,051
ගෙවිය යුතු ආදායම් බදු	15	17,673,641	-	17,673,641
අනිකුත් ගෙවිය යුතු දෑ හා උපචිත වියදම්	16	50,178,353	35,500,610	14,677,743
බැංකු අධිරා		-	-	-
		77,599,683	**38,974,249**	**38,625,434**
මුළු හිමිකම් හා වගකීම්		**1,099,694,171**	**948,648,519**	**151,045,652**

සමාගමෙහි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලය 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට සහතික කරමි.

මූල්‍ය කළමනාකරු

සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

සභාපති
2021 ඔක්තෝම්බර් මස 27 දින
කොළඹදීය

විධායක අධ්‍යක්ෂක
2021 ඔක්තෝම්බර් මස 27 දින
කොළඹදීය

සී/ස ලංකා පොස්පේට් සමාගම

2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයුම් (නැවත සකසන ලද)	මුළු හිමිකම්
2019 මාර්තු 31 දිනට ශේෂය (කලින් දක්වා තිබූ පරිදි)	**72,510,000**	**79,139,711**	**619,996,764**	**771,646,475**
ගැලපීම් - මෝටර් වාහන (සටහන 26-1)	-	33,000,000	-	33,000,000
ගැලපීම් - හානිකරන සඳහා වෙන්කිරීම් (සටහන 26-1)			14,348,061	14,348,061
ගැලපීම් - සේවක ණය (සටහන 26-III)			562,762	562,762
2019 අප්‍රේල් 01 දිනට ශේෂය (නැවත සකසන ලද)	**72,510,000**	**112,139,711**	**634,907,587**	**819,557,297**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය (නැවත සකසන ලද)	-	-	5,488,910	5,488,910
දේ.පි.ද. මත විලම්බිත බදු (සටහන 24)		16,313,125		16,313,125
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ	-	-	(2,981,243)	(2,981,243)
වර්ෂය තුළ ලාභාංශ ගෙවීම්	-	-	(7,000,000)	(7,000,000)
2020 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**128,452,836**	**630,415,254**	**831,378,089**
2020 අප්‍රේල් 01 දිනට ශේෂය	**72,510,000**	**128,452,836**	**630,415,254**	**831,378,089**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	124,017,192	124,017,192
දේ.පි.ද. ප්‍රත්‍යාගණන මත විලම්බිත බදු (සටහන 24)		5,502,938	-	5,502,938
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණන අලාභ	-	-	(12,025,911)	(12,025,911)
ලාභාංශ ගෙවීම්	-	-	(5,000,000)	(5,000,000)
වර්ෂය තුළ ලාභාංශ ගෙවීම්				
2021 මාර්තු 31 දිනට ශේෂය	**72,510,000**	**133,955,774**	**737,406,534**	**943,872,308**

සී/ස ලංකා පොස්පේට් සමාගම

2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	2021 මාර්තු 31	2020 මාර්තු 31
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
බදු වලට පෙර ලාභය	150,582,469	13,480,162
ගැලපීම්,		
ක්ෂයවීම	41,316,039	40,856,995
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	8,172,671	7,407,304
හානිකරණ සඳහා ප්‍රතිපාදන	-	2,302,687
පොළී ආදායම්	(26,947,471)	(35,579,877)
ලාභාංශ ආදායම්	-	(419,000)
Esc කපා හැරීම්	2,278,392	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**175,402,100**	**28,048,272**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම		
තොග	(2,921,003)	866,775
වෙළඳ ලැබිය යුතු දෑ	(29,587,368)	28,507
තැන්පතු, ඉදිරියට කල ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ	(4,919,934)	4,929,996
වෙළඳ ගෙවිය යුතු දෑ	6,274,051	(6,387,232)
අනිකුත් ගෙවිය යුතු දෑ හා උපචිත වියදම්	14,677,743	5,350,754
හානිකරණය සඳහා වෙන්කිරීම		
	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) මුදල් ප්‍රවාහය	**158,925,588**	**32,837,072**
ගෙවූ ආදායම් බදු/ආර්ථික සේවා ගාස්තු/රඳවාගැනීමේ බදු	(8,603,704)	(2,721,817)
	-	-
විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම්	(7,817,778)	(6,521,624)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**142,504,107**	**23,593,631**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(3,881,307)	(4,380,431)
	-	-
ලැබුණු පොළී	26,947,471	35,579,877
කෙටිකාලීන තැන්පතුවල ආයෝජන	(124,676,966)	(66,328,058)
ලැබුණු ලාභාංශ	-	419,000
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(101,610,803)**	**(34,709,612)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ගෙවූ ලාභාංශ	(5,000,000)	(7,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(5,000,000)**	**(7,000,000)**
මුදල් හා මුදල් සමාන දෑ වල වර්ෂය තුළ සිදුවූ ශුද්ධ වෙනස්වීම	**35,893,304**	**(18,115,980)**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	25,977,564	47,508,725
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 08)	**61,870,868**	**25,977,564**

වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ හි විශ්ලේෂණය	2021 මාර්තු 31	2020 මාර්තු 31
අතැති මුදල් හා බැංකුවේ මුදල	61,870,868	25,977,564
	61,870,868	**25,977,564**

5 දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය ප්‍රත්‍යාගණනය	2020 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතු කිරීම	ඉවත් කිරීම්	2021 මාර්තු 31 දිනට ශේෂය
	(නැවත සකසන ලද)			
ගොඩනැගිලි	148,942,334.00	813,255	-	149,755,589
අභ්‍යන්තර මාර්ග	65,139,730.22	-	-	65,139,730
යන්ත්‍ර සහ පිරියත	100,448,984.21	19,500	11,513,434	88,955,050
මෝටර් වාහන	96,515,000.00	-	-	96,515,000
කාර්යාල උපකරණ	7,043,539.41	192,030	-	7,235,569
විදුලි උපකරණ	354,784.26	216,942	-	571,726
ලීබඩු සහ සවිකිරීම්	7,395,433.37	557,331	-	7,952,764
පරිගණක දෘඩාංග සහ මෘදුකාංග	4,007,065.00	2,082,250	-	6,089,315
	429,846,870	**3,881,307**	**11,513,434**	**422,214,744**

ක්ෂය	2020 අප්‍රේල් 01 දිනට ශේෂය	වර්ෂය සඳහා අය කිරීම්	මාරු කිරීම්	2021 මාර්තු 31 දිනට ශේෂය
	(නැවත සකසන ලද)			
ගොඩනැගිලි	5,868,500	5,957,693	-	11,826,193
අභ්‍යන්තර මාර්ග	19,398,138	3,247,924	-	22,646,062
යන්ත්‍ර සහ පිරියත	8,890,288	8,894,042	-	17,784,331
මෝටර් වාහන	19,303,000	19,303,000	-	38,606,000
කාර්යාල උපකරණ	1,404,083	1,431,812	-	2,835,896
විදුලි උපකරණ	13,653	41,199	-	54,852
ලීබඩු සහ සවිකිරීම්	1,410,578	1,516,719	-	2,927,296
පරිගණක දෘඩාංග සහ මෘදුකාංග	709,906	923,650	-	1,633,557
	56,998,147	**41,316,039**	**-**	**98,314,186**

ශුද්ධ පොත් අගය	2020 අප්‍රේල් 01 දිනට ශේෂය	වර්ෂය සඳහා අය කිරීම්	මාරු කිරීම්	2021 මාර්තු 31 දිනට ශේෂය
	(නැවත සකසන ලද)			
ගොඩනැගිලි	143,073,834	(5,144,438)	-	137,929,396
අභ්‍යන්තර මාර්ග	45,741,592	(3,247,924)	-	42,493,668
යන්ත්‍ර සහ පිරියත	91,558,696	(20,387,977)	-	71,170,719
මෝටර් වාහන	77,212,000	(19,303,000)	-	57,909,000
කාර්යාල උපකරණ	5,639,456	(1,239,783)	-	4,399,674
විදුලි උපකරණ	341,131	175,743	-	516,874
ලීබඩු සහ සවිකිරීම්	5,984,856	(959,388)	-	5,025,468
පරිගණක දෘඩාංග සහ මෘදුකාංග	3,297,159	1,158,600	-	4,455,759
	372,848,723	**(48,948,166)**	**-**	**323,900,557**

කාරක ප්‍රාග්ධනය	2020 අප්‍රේල් 01 දිනට ශේෂය	එකතු කිරීම	ඉවත් කිරීම්	2021 අප්‍රේල් 01 දිනට ශේෂය
නව කම්හල් ස්ථාපනය කිරීම	7,440,000	11,513,434	-	18,953,434
නව ආරක්ෂක කාමරය	-	556,551	(556,551)	-
රියදුරු වැසිකිලි පද්ධතිය	-	256,704	(256,704)	-
ගරාජය	73,258	-	-	73,258
	7,513,258	**12,326,689**	**(813,255)**	**19,026,692**
එකතුව	**380,361,981**			**342,927,249**
භානිකරණයට වෙන්කිරීම	**-**		**-**	**-**
	380,361,981			**342,927,249**

	2020/21 - මාර්තු	***2019/20***
ඉන්වෙස්ටිමන්ට් ඉන් GSMB ටෙක්නිකල් සර්විස් (පුද්ගලික) සමාගමෙහි ආයෝජනය		
6 එකක් රුපියල් 10 බැගින් වූ කොටස් 100,000/-	**1,000,000**	**1,000,000**

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	2021 මාර්තු 31	***2019/20***
7 තොග		
වෙළඳ තොග - එප්පාවල (අවසාන නිමි තොග)	8,939,023	32,662,585
- (අමුදව්‍ය තොග)	20,428,571	16,364,752
වෙළඳ තොගය - වාරියපොළ	4,499,504	447,014
උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන්කිරීම	(550,178)	(130,278)
වෙනත් ද්‍රව්‍ය තොග - වාරියපොළ	2,377,209	612,123
සාමාන්‍ය තොග	75,305,154	58,122,084
	110,999,283	**108,078,280**
යල්පිනු තොග සඳහා වෙන්කිරීම	(3,808,331)	(3,808,331)
	107,190,952	**104,269,949**
8 වෙළඳ ලැබිය යුතු ද		
ණයගැතියෝ ERP/HERP අලෙවිය - එප්පාවල	71,447,853	43,800,784
මුදලට විකුණුම් එකතුකිරීමේ ගිණුම - එප්පාවල	-	(10,640)
ණයගැතියෝ - පොල් පොහොර ව්‍යාපෘතිය	3,876,687	1,947,027
(-) බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම	(10,568,004)	(10,568,004)
	64,756,536	**35,169,168**
9 තැන්පතු, කලින් ගෙවීම හා වෙනත් ලැබිය යුතු ද		
සේවක ණය සහ අත්තිකාරම්	37,270,275	40,373,710
තැන්පතු සහ ඉදිරියට ගෙවීම්	14,678,101	2,093,333
කෙටිකාලීන ආයෝජන වලින් ලැබිය යුතු (ස්ථාවර තැන්පතු) පොළී ආදායම	8,838,504	12,874,011
කෙටිකාලීන ආයෝජන වලින් ලැබිය යුතු (රෙපෝ) පොළී ආදායම	36,870	-
	60,823,750	**55,341,054**
10 ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්		
ස්ථාවර තැන්පතු	461,124,815	336,447,849
	461,124,815	**336,447,849**
11 මුදල් සහ මුදල් සමාන ද		
රෙපෝ - ලංකා බැංකුව	53,000,000	-
බැංකුවේ ඇති මුදල්	8,720,868	25,827,564
අතැනි මුදල්	136,000	136,000
මුද්දර සංචිතය	14,000	14,000
	61,870,868	**25,977,564**
12 ප්‍රකාශිත ප්‍රාග්ධනය		
නිකුත් කර සම්පූර්ණයෙන්ම ගෙවා ඇත		
සාමාන්‍ය කොටස් 7,251,000	**72,510,000**	**72,510,000**

(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	2021 මාර්තු 31	***2019/20***
13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම		
2020 අප්‍රේල් 01 දිනට ශේෂය	**43,937,440**	**40,070,517**
වත්මන් සේවා පිරිවැය	3,778,927	2,887,350
වර්ෂය සඳහා පොළී වියදම	4,393,744	4,519,954
වර්ෂය තුළ ගෙවීම්	(7,817,778)	(6,521,624)
විශ්‍රාම බැඳියාව මත ආයුගණන අලාභය	12,025,911	2,981,243
2021 අප්‍රේල් 01 දිනට ශේෂය	**56,318,245**	**43,937,440**
14 විලම්ඹිත බදු		
වර්ෂය ආරම්භක ශේෂය	34,358,741	36,133,599
ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගන්නා ලද	(6,951,868)	14,538,267
වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගන්නා ලද	(5,502,938)	(16,313,125)
වර්ෂය අවසාන ශේෂය	21,903,935	34,358,741
15 බදු අයකිරීම සඳහා ප්‍රතිපාදන		
ඉ/ගෙ ශේෂය	-	2,274,594
(+) වර්ෂය සඳහා ප්‍රතිපාදන	33,517,145	447,223
(-) වර්ෂය සඳහා ගෙවීම්	(8,603,704)	(2,721,817)
	24,913,441	**-**
බැරකම්		
(-) ESC ලැබිය යුතු	(4,715,845)	(6,994,237)
(-) ලැබිය යුතු රැදවුම් බද්ද	(2,523,955)	(2,523,955)
ප/ගෙ ශේෂය	**17,673,641**	**(9,518,192)**
16 අනිකුත් ගෙවිය යුතු දෑ හා උපචිත වියදම්		
උපචිත වියදම්	36,428,896	23,464,321
අනිකුත් ගෙවිය යුතු දෑ	13,749,456	12,036,288
	50,178,353	**35,500,610**
17 ආදායම්		
ඊ.ආර්.පී. (කි.ග්‍රෑ. 50)	599,124,595	388,190,020
වාරියපොල (ERP) විකුණුම්	629,875	-
එච්.ඊ.ආර්.පී	117,691,931	109,098,950
ඊ.ආර්.පී. (කි.ග්‍රෑ. 25)	9,680	-
පොල් පොහොර විකුණුම් - පරණ	1,080,160	12,714,610
පොල් පොහොර YPM සමස්ථ විකුණුම්	1,080,800	
පොල් පොහොර YPM සිල්ලර විකුණුම්	28,000	
පොල් පොහොර APM සම්පූර්ණ විකුණුම්	26,275,880	
හර්ප් සේල්ස් ගොවිජන සේවා සහ බෙදාහරින්නන්	31,250	
පොල් පොහොර APM සිල්ලර වකුණුම්	571,400	
EPR (1KG)	262,975	-
ERP විකුණුම් Govijana සේවා සහ බෙදාහරින්නේ	3,328,644	-
ERP විකුණුම් (කි.ග්‍රෑම් 10 බෑග්ස්)	259,175	-
	750,374,365	**510,003,580**

18. විකුණුම් පිරිවැය	2020/2021 මාර්තු 31 දිනට	2019/20	වෙනස
ආරම්භක වෙළඳ තොගය (2020 අප්‍රේල් 01 දිනට)	**49,027,337**	**30,749,355**	**(18,277,982)**
වර්ෂය තුළ වියදම් මාරු කිරීම			
කාර්යාල මණ්ඩල වේතන - ක්‍රමර්	24,161,809	14,646,265	(9,515,544)
බලය - ක්‍රමර් 1 10%	143,479	131,754	(11,725)
අභ්‍යන්තර ප්‍රවාහන	-	362,494	362,494
ක්‍රමරයේ අමතර කොටස්	233,634	26,109	(207,526)
පුද්ගල ආරක්ෂක උපකරණ	35,324	33,731	(1,592)
ආයුධ සහ මෙවලම්	2,208	-	(2,208)
ක්ෂය - නිෂ්පාදන	14,892,934	16,241,221	1,348,286
පුරස්කාරය	44,224,542	34,940,008	(9,284,534)
පරීක්ෂණාගාර වියදම්	115,572	109,566	(6,006)
පරීක්ෂණාගාර ගොඩනැගිලි නඩත්තුව	1,571	304,426	302,855
සේවක පාරිශ්‍රමික	77,390,385	74,585,522	(2,804,862)
පොලිෆොපේලීන් ඇසුරුම්	53,556,198	49,590,480	(3,965,718)
බදින කොකු	476,226	407,538	(68,688)
පාලම් තරාදි ගොඩනැගීම	-	543	543
ලිහිසි තෙල්	1,712,171	1,816,291	104,120
5 රෝලරය - සඳහා බලය 75%	20,374,061	18,709,046	(1,665,015)
කම්හල් අමතර කොටස් - 5 රෝලරය (අළුත්)	10,570,942	13,665,985	3,095,043
කම්හල් නඩත්තුව 5 රෝලරය	811,211	2,140,368	1,329,157
කම්හල් නඩත්තුව 160 TGM	4,352,501	2,580,044	(1,772,457)
ෆෝක්ලිෆ්ට් - ඉන්ධන	163,930	58,217	(105,713)
ෆෝක්ලිෆ්ට් නඩත්තුව	292,494	164,550	(127,944)
වීල්ලෝඩරය නඩත්තුව 30%	9,929	13,708	3,779
ෆෝක්ලිෆ්ට් - ඉන්ධන	198,432	176,284	(22,148)
ෆෝක්ලිෆ්ට් නඩත්තුව	274,647	579,687	305,040
ෆෝක්ලිෆ්ට් ඉන්ධන (Uni Carrier)	326,499	328,774	2,275
ෆෝක්ලිෆ්ට් නඩත්තුව (Uni Carrier)	204,180	5,688	(198,492)
පුද්ගල ආරක්ෂක උපකරණ	253,273	119,970	(133,302)
ආයුධ සහ මෙවලම්	505,457	1,345,676	840,219
අසුරන වැසුම් යන්ත්‍ර වියදම්	46,649	85,507	38,858
සේවක පාරිශ්‍රමික (ආකරය)	10,272,335	4,420,443	(5,851,891)
වීල්ලෝඩර් - ඉන්ධන	43,649	49,046	5,398
වීල්ලෝඩරය නඩත්තුව (නව)	1,224,886	942,034	(282,852)
වීල්ලෝඩරය නඩත්තුව	-	2,170	2,170
924 කේ වීල්ලෝඩරය ඉන්ධන	1,494,553	1,207,721	(286,832)
924 කේ වීල්ලෝඩරය නඩත්තුව	1,628,527	1,488,077	(140,449)
වීල්ලෝඩරය නඩත්තුව (නව)	632,420	865,130	232,709
කැනිම් උපකරණ නඩත්තුව	129,751	1,650	(128,101)
සම්පීඩන නඩත්තුව	188,945	134,673	(54,272)
තෙල් හා ලිහිසි තෙල්	107,443	88,971	(18,472)
යන්ත්‍ර සූත්‍ර කුළියට ගැනීම	8,713,018	8,354,530	(358,489)
පුද්ගල ආරක්ෂක උපකරණ	165,640	-	(165,640)
අභ්‍යන්තර මාරු කිරීම - ට්‍රැක්ටරය 49-7541	197,878	58,291	(139,586)
අභ්‍යන්තර මාරු කිරීම - 46 ශ්‍රී 5636	1,658	1,108	(549)
ට්‍රේලරය - 44 ශ්‍රී 6600	49,105	5,357	(43,748)
නව ට්‍රැක්ටර් ට්‍රේලරය 01	182,679	-	(182,679)
